# අප අවට සත්තු.

## පාඩම් අංක 04.

01. පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.

1. මිනිසා මඟින් සතුන්ට ලැබෙන දේවල් 4ක් ලියන්න.
2. සතුන් මඟින් මිනිසාට ලැබෙන දේවල් 4ක් ලියන්න.
3. පහත සතුන්ට සුවිශේෂි වූ ඔවුන්ගේ පැවැත්මට උපකාරී වන ලක්ෂණය බැගින් ලියන්න.
4. කිරි බී වැඩෙන සතුන් හඳුන්වන පොදු නාමය කුමක් ද?
5. සතුන් ගන්නා ආහාර අනුව ඔවුන් බෙදිය හැකි ප්‍රධාන කොටස් තුන ලියන්න.
6. ශාක භක්ෂක සතුන් සිවුදෙනෙකු නම් කරන්න.
7. මාංශ භක්ෂක සතුන් සිවුදෙනෙකු නම් කරන්න.
8. සර්ව භක්ෂක සතුන් සිවුදෙනෙකු නම් කරන්න.
9. සතුන්ට හා ශාකවලට හානිකර මිනිස් ක්‍රියාකාරකම් 3ක් ලියන්න.
10. ලංකාවට ආවේණික ඒක දේශික පක්ෂීන් දෙදෙනෙකු නම් කරන්න.
11. ලංකාවට ආවේණික ඒක දේශික ක්ෂීරපායි සතුන් දෙදෙනෙකු නම් කරන්න.
12. ලංකාවට ආවේණික ඒක දේශික මත්ස්‍යයින් දෙදෙනෙකු නම් කරන්න.
13. ලංකාවට ආවේණික ඒක දේශික උරගයින් දෙදෙනෙකු නම් කරන්න.
14. ජීවන චක්‍රයක් දැකය හැකි සතුන් දෙදෙනෙකු නම් කරන්න.
15. සමනලයාගේ ජීවන චක්‍රයේ අවස්ථා කීයද?

02. දෙපස ඇති යෙදුම්වල සම්බන්ධතා හඳුනා ගනිමින් මුල් යෙදුම් පෙළේ ඇති අක්ෂර දෙවන යෙදුම් පෙළට අදාල වරහන තුළ යොදන්න.

| | | | |
|---|---|---|---|
| **A.** | මිනිසාට ආර්ථික වාසි ලබාදීම. | (............) | හබන්කුකුළා |
| **B.** | මල් පරාගනයට දායක වේ. | (............) | කොරපොතු |
| **C.** | ඖෂධ සපයා දෙන සතෙකි | (............) | හූනා |
| **D.** | වගාවට අවශ්‍ය පොහොර ලබා දේ. | (............) | කටුස්සා |
| **E.** | ආරක්ෂාව සපයා දේ. | (............) | සමනලයා |
| **F.** | පළතුරු වගාවට හානිකරයි. | (............) | ගවයා |
| **G.** | බීජ ව්‍යාප්තියට උදවු වේ. | (............) | බුලත්හපයා |
| **H.** | පරිසරය පිරිසිදු කරයි. | (............) | මීමැස්සා |

**I.** පරිසරය අලංකාර කරවයි. (............) වවුලා

**J.** මාළුවාගේ ආරක්ෂාවට පිහිටා ඇත. (............) බල්ලා

**K.** වලිගය කඩා දමා පලා යයි. (............) කස්තුරි මුවා

**L.** ඒක දේශික පක්ෂියෙකි. (............) දියනයා

**M.** ඒක දේශික මත්ස්‍යයෙකි. (............) කපුටා

**N.** ඒක දේශික උරගයෙකි. (............) එළුවා

**O.** සමේ වර්ණය වෙනස් කරයි. (............) පලතුරු මැස්සා

03. පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ලංකාවේ ඒක දේශික ක්ෂීරපායී සත්වයෙකි.

**(I)** පිඹුරා **(II)** කැහිබෙල්ලා **(III)** කළුවඳුරා

2. ආරක්ෂාව සඳහා කටුවක් පිහිටා ඇති සතෙකි.

**(I)** කුකුළා **(II)** ඉබ්බා **(III)** ඉත්තෑවා

3. අතීතයේ ගමනා ගමනයට යොදා නොගත් සතෙකි.

**(I)** අශ්වයා **(II)** අලියා **(III)** එළුවා

4. අතීතයේ පණිවුඩ හුවමාරු කර ගැනීමට දායක වූ සතෙකි.

**(I)** කපුටා **(II)** සැලලිහිණියා **(III)** කහ කුරුල්ලා

5. පස සරු කිරීමට උදව් වේ.

**(I)** උෟරා **(II)** උෟරු මීයා **(III)** ගැඩවිලා

6. අශ්වයාගේ ගමන් විලාශය පෙන්වන වන්නම වේ.

**(I)** මුසලඩි වන්නම **(II)** තුරඟා වන්නම **(III)** හනුමා වන්නම

7. මාළුවකු ආශ්වාස කරන්නේ,

**(I)** නාසයෙනි **(II)** මුවෙනි **(III)** කරමල් වලිනි

8. පාචනය, කොළරාව වැනි රෝග බෝ කරන්නේ,

**(I)** මදුරුවා **(II)** ගෙමැස්සා **(III)** මී මැස්සා

9. මැටි යොදාගෙන නිවස තනා ගනියි.

**(I)** කුරුමිණියා **(II)** රන් කුඹලා **(III)** රැහැයියා

10. ගොවියාගේ මිතුරකු නොවන සතෙකි.

(I) ගැඩවිලා (II) ගෙම්බා (III) ගොළුබෙල්ලා

11. මල්වල පරාගනයට උදවු කරන සතෙකි.

(I) කුරුමිණියා (II) බත්කූරා (III) මී මැස්සා

12. සතුන්ගෙන් මිනිසුන්ට බෝ නොවන රෝගයකි.

(I) දියවැඩියාව (II) ජලභීතිකාව (III) මහාමාරිය

13. මහාමාරිය රෝගය බෝ කරන්නේ,

(I) මී මැස්සා (II) මීයා (III) හූනා

14. වගාවට අහිතකර කෘමීන් ආහාරයට ගන්නා පක්ෂියෙකි.

(I) ගිරවා (II) බකමූණා (III) පැණි කුරුල්ලා

15. මේ අතරින් උභය ජීවියෙකු ලෙස සැළකෙන සත්වයෙකි.

(I) කටුස්සා (II) ගෙම්බා (III) මාළුවා

16. හාවකුගේ ගමන් විලාශය ගැන කියවෙන වන්නම වන්නේ,

(I) මුසලඩි වන්නම (II) හනුමා වන්නම (III) තුරඟා වන්නම

17. මුහුදු වෙරළේ බිත්තර දමන සත්වයෙකි.

(I) මාළුවා (II) කිඹුලා (III) කැස්බෑවා

18. ආහාර සොයා ගැනීමට ජලාශ ආශ්‍රිතව සැරිසරන පක්ෂියෙකු නොවේ.

(I) දියකාවා (II) පිළිහුඩුවා (III) කපුටා

19. කුකුළා අයත්වන සත්ව කාණ්ඩය වන්නේ,

(I) ශාක භක්ෂක (II) මාංශ භක්ෂක (III) සර්ව භක්ෂක

20. ක්ෂීරපායි සතකු වන මාළුවා වන්නේ,

(I) තෝරා (II) මෝරා (III) තල්මසා

21. සතුනට ලබාදිය යුතු දෙයකි.

(I) මුදල් (II) නිවාස (III) ආදරය හා කරුණාව

22. අහිතකර ලෙස කෘමිනාශක භාවිතයෙන්,

(I) හිතකර සතුන් විනාශ වේ. (II) අහිතකර සතුන් විනාශ වේ.
(III) හිතකර හා අහිතකර යන සතුන් සතුන් දෙවර්ගය ම විනාශ වේ.

23. "සත්වෙත් මහත් අදර - ලත්යුත් සිදත් කුමරු" යන ගීත කොටස ඇතුළත් වන්නම වන්නේ,

(I) මුසලඩි වන්නම (II) හනුමා වන්නම (III) තුරඟා වන්නම

24. වේගයෙන් දිවිය හැකි සතෙකි.

(I) ඉබ්බා (II) එළුවා (III) මුවා

25. ශාක කොටස් මෙන්ම සත්ත්ව කොටස් ද ආහාරයට ගනියි.

(I) මුවා (II) හාවා (III) ලේනා

26. මීයාගේ ඇගේ වසන මැක්කෙකු මඟින් බෝවන ලෙඩකි.

(I) මී උණ (II) මහාමාරිය (III) ඩෙංගු

27. නිවස ආශ්‍රිතව ගැවසෙන සතෙකි.

(I) ලේනා (II) ඌරා (III) හූනා

28. තියුණු ඉවක් ඇති සතෙකි.

(I) බල්ලා (II) ඉබ්බා (III) නරියා

29. කථා කිරීමේ හැකියාව ඇති සතෙකි.

(I) කපුටා (II) දෙමළිච්චා (III) ගිරවා

30. පාද අටක් ඇති සතෙකි.

(I) මී මැස්සා (II) මකුළුවා (III) සමනලයා

ප්‍රදීප් කුමාර

කෑ/මාව/ අශෝක ප්‍රා.වි.

මාවනැල්ල අධ්‍යාපන කලාපය